# කාර්ය මණ්ඩල පුවත්

මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති වශයෙන් කටයුතු කළ ඩබ්ලිව්. තෙන්නකෝන් මහතා, 1967 අගෝස්තු 31 වැනි ද සිට මහ බැංකුවේ අධිපති වශයෙන් පත් කරනු ලැබීය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ලංකාවේ විකල්ප අධිපති ද වන බැංකුවේ අධිපතිවරයා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ලංකාවේ අධිපතිවරයා වන මුදල් අමාත්‍ය ගරු යූ. බී. වන්නිනායක මහතා හා සමග, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හා ජාත්‍යාන්තර සංවර්ධන හා ප්‍රතිසංස්කරණ බැංකුවේ "රියෝ ද ජැනයිරෝ"හි දී පැවැත්වුණු සාකච්ඡාවට සහභාගි වූහ. 1967 සැප්තැම්බර් 24 වැනි දින එතුමා ලංකාවෙන් පිටත් වූ අතර, 1967 ඔක්තෝබර් 7 වැනි දින සැපත් වූහ.

අධිපතිවරයා බැහැරව සිටි ඉහත කී කාලය තුළදී, නියෝජ්‍ය අධිපති එස්. ජ්. පි. ජැන්ස් මහතා, මුදල් පණතේ 24 වැනි ඡෙදය ප්‍රකාර මහ බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කළේය.

මුදල් අමාත්‍යාංශයේ නිත්‍ය ලේකම්, එච්. ජේ. සමරක්කොඩි මහතා ලෝක බැංකුවේ හා අරමුදලේ සාකච්ඡාව සඳහා දිවයිනෙන් බැහැරව සිටි, 1967 සැප්තැම්බර් 19 වැනි ද සිට ඔක්තෝබර් 17 වැනි ද දක්වා වූ කාලය තුළදී, මුදල් මණ්ඩලයේ නිල සාමාජිකයා වශයෙන්, ජනසතු සේවා හා ක්‍රීඩා අමාත්‍යාංශයේ නිත්‍ය ලේකම් එම්. රාජේන්ද්‍ර මහතා කටයුතු කළේය.

ආචාර්ය ගාමණී කොරයා, ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ නිත්‍ය ලේකම් වශයෙන් රජයේ සේවාවේ තවදුරටත් නිරත විය.

අධිපතිගේ සහකාර ඒ. එච්. අබේනායක මහතා 1967 මාර්තු 1 වැනි දින සිට විශ්‍රාම ගන්නා ලදී.

අධිපතිගේ සහකාර එස්. ජ්. පි. ජැන්ස් මහතා 1967 සැප්තැම්බර් 5 වැනි ද සිට නියෝජ්‍ය අධිපති වශයෙන් පත් කරනු ලැබීය.

ප්‍රධාන ගණකාධිකාරි එස්. ඕ. අමරසිංහ මහතා 1967 ජූනි 6 වැනි ද සිට අධිපතිගේ සහකාරයෙකු වශයෙන් පත්කරනු ලැබීය.

බැංකු පරිපාලන අධ්‍යක්ෂ සහ වැඩ බලන විනිමය පාලක පි. වී. එම්. ප්‍රනාන්දු මහතා 1967 ජූනි 6 වැනි දින සිට අධිපතිගේ සහකාරයෙකු වශයෙන් පත් කරනු ලැබීය.

අභ්‍යන්තර විගණක ඒ. සී. පි. ගුණසේකර මහතා මහ බැංකුවේ ලේකම් වශයෙන් 1967 ජූනි 6 වැනි දින සිට පත් කරනු ලැබීය.

ආයතන නිලධාරී එල්. ඩබ්ලිව්. ඒ. වීරසේකර මහතා වැඩ බලන ආයතන අධ්‍යක්ෂ වශයෙන් 1967 ජූනි 6 වැනි දින සිට පත් කරනු ලැබූ අතර, ලේකම් දෙපාර්තමේන්තුවේ ආයතන අංශය, බැංකුවේ වෙනම දෙපාර්තමේන්තුවක් වශයෙන් සකස් කරණු ලැබීය.

නියෝජ්‍ය විනිමය පාලක ජේ. ජී. පි. ජයසුන්දර මහතා වැඩ බලන විනිමය පාලක වශයෙන් 1967 ජූනි 6 වැනි දින සිට පත් කරනු ලැබීය.

මුදල් නිලධාරී සී. එච්. ප්‍රනාන්දු මහතා වැඩ බලන අභ්‍යන්තර විගණක වශයෙන් 1967 ජූනි 6 වැනි දින සිට පත් කරනු ලැබීය.

නියෝජ්‍ය ප්‍රධාන ගණකාධිකාරී කේ. ගුණරත්නම් මහතා වැඩ බලන ප්‍රධාන ගණකාධිකාරි වශයෙන් 1967 ජූනි 6 වැනි දින සිට පත් කරනු ලැබීය.

නියෝජ්‍ය බැංකු පරිපාලන අධ්‍යක්ෂ ඩබ්ලිව්. බී. අළුවිහාරේ මහතා වැඩ බලන බැංකු පරිපාලන අධ්‍යක්ෂ වශයෙන් 1967 ජූනි 6 වැනි දින සිට පත් කරනු ලැබීය.

ක්‍රම සම්පාදන පිළිබඳ අන්තර් කලාපීය උපදේශක වශයෙන් එක්සත් ජාතීන්ගේ සේවාවේ සිටි පී. එච්. සිරිවර්ධන මහතා 1967 සැප්තැම්බර් 10 වැනි දින, නැවත මහ බැංකුවේ සේවාව ඇරඹීය.

ඉරාකයේ ආර්ථික සංඛ්‍යා ලේඛනඥ (ජාතික ගිණුම්) වශයෙන් එක්සත් ජාතීන්ගේ පත්වීමක නිරතව සිටි ආචාර්ය ඩබ්ලිව්. රාසපුත්‍රම්, 1967 ජූනි 1 වැනි දින සිට මහ බැංකුවේ සේවාව නැවත ඇරඹීය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සේවයේ යෙදී සිටි එස්. කනේසදසන් මහතා 1967 අගෝස්තු 31 වැනි දින සිට මහ බැංකු සේවාවෙන් ඉල්ලා අස්විය.

එම්. ස්වාමිනාදන් මහතා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සංඛ්‍යා ලේඛන කාර්යාලයේ ආර්ථික විද්‍යාඥයෙකු වශයෙන් පත්වීමක් භාර ගැනීම සඳහා අවුරුදු දෙකක කාලයකට මුදා හරින ලදී.

ආචාර්ය එම්. ආර්. පී. සල්ගාදු ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සේවාවේ තවදුරටත් නිරත විය.

ජ්‍යෙෂ්ඨ ආර්ථික විද්‍යාඥ සී. ඒ. බී. එන්. ජයරාජා මහතා, 1967 අගෝස්තු 21 සිට 28 දක්වා පැවැති එක්සත් ජාතීන්ගේ ආසියානු සහ ඈත පෙරදිග ආර්ථික කොමිසමේ, බැංකොක් හි පවත්වනු ලැබූ සාකච්ඡා සම්මේලනයකට, මහ බැංකුවේ නියෝජිතයා වශයෙන් සහභාගි විය. 1967 ඔක්තෝබර් 10 වැනි ද සිට 31 වැනි ද දක්වා ඇල්ජියර්ස් හි පවත්වනු ලැබූ එක්සත් ජාතීන්ගේ වෙළඳාම් සහ සංවර්ධන සම්මේලනයේ අමාත්‍ය රැස්වීමකට ද ඔහු සහභාගි විය.

සමාලෝචනයට භාජන වූ වර්ෂය තුළදී පහත සඳහන් නිලධාරීන්ගෙන් සමහරෙක් තාවකාලික ලෙස රජයේ සේවාවට මුදාහැරිය අතර, සමහරෙක් රජයේ සේවාවේ වැඩි දුරටත් නිරතව සිටියහ.

එම්. පී. පෙරේරා මහතා, රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙකු සහ වෙළඳ හා වානිජ අමාත්‍යාංශයේ ආර්ථික උපදේශකයෙකු වශයෙන් තවදුරටත් නිරත විය.

එම්. එම්. සෙනෙවිරත්න, ඩී. ආර්. සිරිවර්ධන, ආචාර්ය ඇන්. රාමචන්ද්‍රන් සහ ආචාර්ය ජී. උස්වත්තෙ ආරච්චි සහ එන්. එම් කප්පාගොඩ යන මහත්වරු, ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ කටයුතු වල තවදුරටත් නිරත වූහ.

පී. බී. කරඳවල මහතා අමාත්‍යාංශයේ සේවාවේ තවදුරටත් නිරත විය.

ඩබ්ලිව්. බී. අළුවිහාරේ මහතා සහ ආචාර්ය එස්. ටී. ජී. ප්‍රනාන්දු, පිළිවෙලින් ආයෝජන සංගත හා තේ කොමිසම යන කමිටු වල සේවාව සඳහා අර්ධකාලීන වශයෙන් මුදා හරිනු ලැබීය.

පෙරසේම මහ බැංකුවේ නිලධාරිහු බොහෝ දෙනෙක් රජය විසින් පත් කරන ලද විවිධ කමිටු වල සේවාවන්හි යෙදුනහ.